# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1396/4 – 2005 ජුනි 06 වැනි සඳුදා – 2005.06.06

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

ඉහත සඳහන් පනතේ 24අ(2) සහ 24 ආ වගන්ති සමග කියවිය යුතු, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2005 මැයි මස 26 වැනි දින,
කොළඹ දී ය.

### නියමාවලිය

01. මෙම නියමාවලිය 2005 අංක 01 දරන ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2005 මාර්තු මස 14 දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

02. (මෙහි මින්මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24ආ වගන්තිය යටතේ සාදන ලද නියමයක් ලෙස පිළිගෙන 2005.06.03 දින අංක 1395/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද මෙම නියමාවලිය (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයීය, ස්වාමි විපුලානන්ද සෞන්දර්යය අධ්‍යයන ආයතනයට අදාළ කරගනු ලැබිය යුතු ය.

03. එකී නියමය කළ දිනට ඉක්බිතිවම පූර්වයෙන් වූ දිනයේ ස්වාමි විපුලානන්ද විද්‍යාලයේ, සංගීත සහ නැටුම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වූ සෑම ශිෂ්‍යයකුටම ඔහුගේ පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසු අවස්ථාවෝචිත පරිදි එම විශ්වවිද්‍යාලයේ නාමයෙන් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ප්‍රදානය කරනු ලැබිය යුතු අතර එම ආයතනයට විශ්වවිද්‍යාලය මගින් ප්‍රදානය කරන කිසියම් උපාධියක් හෝ උසස් ගෞරවනීය නාමයක් ප්‍රදානය කිරීමට තිසි බලයක් නොතිබිය යුතු ය.

එසේ වුවද, සෑම ශිෂ්‍යයෙකුම, එම නියමය කළ දිනට ඉක්බිතිවම පූර්වයෙන් වූ දිනයේ එම විද්‍යාලයේ ශිෂ්‍යයකු ලෙසින් ඔහු විසින් භුක්ති වින්දා වූ පහසුකම් සහ වරප්‍රසාද අඛණ්ඩව භුක්ති විඳිය යුතු ය.

1A-G 005535 -800 (2005/06)

4. පනතේ විධිවිධානවලට සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සහ විශ්වවිද්‍යාලවල බලතල, කාර්ය සහ කර්තව්‍යයන්ට යටත්ව ආයතනයට–

(අ) ශිෂ්‍යයන් ඇතුල් කර ගැනීමට ;

(ආ) ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි ඇතැම් සෞන්දර්යය අධ්‍යයන ශාඛා සඳහා උපදෙස්, පුහුණුවීම්, පර්යේෂණ සහ වැඩිදියුණුව සඳහා කටයුතු සැලසීමට ;

(ඇ) ලලිත කලා පිළිබඳව ප්‍රවීණත්වය ලැබූ තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්යය සඳහා විශ්වවිද්‍යාලයේ අනුමතය ඇතිව විභාග පැවැත්වීම සහ එම විභාග වලින් සාමාර්ථය ලබා, විශ්වවිද්‍යාලය විසින් සාදනු ලැබිය හැකි අතුරු ව්‍යවස්ථා මගින් පනවන ලද වෙනත් කොන්දේසි සපුරාලීමෙන් උපාධි හෝ අභිඥාන පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබූ තැනැත්තන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීමට ;

(ඈ) විශ්වවිද්‍යාලයේ අනුමතය ඇතිව, සහ අවශ්‍ය සෑම විටම කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, සෞන්දර්යය අධ්‍යයනයේ දී ප්‍රදානය කරනු ලැබිය යුතු, අභිඥානපත්‍ර සහ සහතිකපත් නිශ්චය කිරීම ;

(ඉ) ආයතනයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ පිටරට වෙනත් විශ්වවිද්‍යාල හෝ ආයතන සමග ආචාර්යවරයන්, ශිෂ්‍යයන් සහ ශාස්ත්‍රධරයන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(ඊ) අතුරු ව්‍යවස්ථාවකින් නියම කරනු ලැබිය හැකි පරිදි, ආයතනයට ඇතුල්වීමට අපේක්ෂා කරන තැනැත්තන්ගේ යහපත පිණිස විශ්වවිද්‍යාලවලදී හෝ නැගෙනහිර විශ්වවිද්‍යාලය හා සමාන අධ්‍යාපන ආයතනවල දී සාමාර්ථය ලත් විභාග හා ගතකල අධ්‍යයන කාලසීමාව ආයතනයේ එවැනි විභාගවලට හා එවැනි අධ්‍යයන කාලසීමාවලට හෝ ඉන් යම් කොටසකට සමාන ලෙස පිළිගැනීම හා ඕනෑම අවස්ථාවක ඒ පිළිගැනීම ඉවත්කර ගැනීමට විශ්වවිද්‍යාල සනාතන සභාවට නිර්දේශ කිරීමට ;

(උ) ආයතනයේ ඉගැන්වීමේ කටයුතු, පුහුණු කිරීම්, පර්යේෂණ පැවැත්වීම්, වැඩිදියුණු කිරීම්, උපදේශන කටයුතු සඳහා වූ කාර්ය සඳහා ඉගැන්වීමේ, පුහුණු කිරීමේ, සංවර්ධනය කිරීමේ හෝ උපදේශන කටයුතු කිරීමේ කාර්යය සඳහා පුස්තකාල, රසායනාගාර. කලාගාර, කලායතන හා වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම ;

(ඌ) යම් ඉගැන්වීමේ, පරිපාලනය කිරීමේ සහ වෙනත් තනතුරු ඇති කිරීම, නැති කිරීම හෝ අත්හිටුවීමට විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(එ) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ප්‍රදර්ශන, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇති කිරීම සහ ප්‍රදානය කිරීමට ;

(ඒ) පාඨමාලා හෝ පාඨමාලාවල කොටස් ආයතනයෙන් බාහිර වූ ස්ථානවල පැවැත්වීමට කටයුතු කිරීම, ඒ සඳහා විධිවිධාන සලස්වන අතුරු ව්‍යවස්ථා අනුව පිළියෙල කිරීම ;

(ඔ) රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තියට සහ ඒ සඳහා පනවන ලද කිසියම් රීතියකට අනුකූලව ගාස්තු ලබා ගැනීම ;

(ඕ) ආයතනයේ ඉදිරි පරමාර්ථ ඉටුකර ගැනීම පිණිස ඉහත සඳහන් බලතල කාර්යයන් සහ කර්තව්‍යවලට ආනුෂංගික වූ හෝ සම්බන්ධිත වෙනත් යම් කාරණා සියල්ල ඉටු කිරීමට,

බලය තිබිය යුතු ය.

05. ආයතනය පහත දැක්වෙන අයුරින් සමන්විත විය යුතු ය.–

(i) කළමනාකරණ මණ්ඩලය ;

(ii) ශාස්ත්‍රීය කමිටුව ;

(iii) අධ්‍යයන දෙපාර්තමේන්තු ;

(iv) නියමාවලියකින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ වෙනත් යම් මණ්ඩලයක්.

06. ආයතනයේ නිලධරයන් පහත දැක්වෙන පරිදි විය යුතු ය.-

(i) අධ්‍යක්ෂවරයා ;

(ii) ආයතනයේ වගකිව යුතු ධූරයන් දරන වෙනත් යම් තැනැත්තකු.

07. (1) ආයතනයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. පසුව පත්වන සෑම අධ්‍යක්ෂවරයෙකුම (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් නම්කල තැනැත්තන් තුන්දෙනෙකුගෙන් යුතු මූල මණ්ඩලයක් මගින් විශ්වවිද්‍යාල සභාවේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

එසේ වුවද, කිසිම තැනැත්තකු අනුක්‍රමික ධූර කාලසීමා දෙකකට වැඩි වාර ගණනක් අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා, ධූරය කලින් අත්හැර ගියහොත් මිස හෝ (3) වන අනුඡේදය යටතේ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලයක් ගතවීම හෝ ඔහුට හැටපස් වන විය සම්පූර්ණවීම යන මේ අවස්ථාවලින් කලින් එළඹෙන කවර අවස්ථාව තෙක් ධූරය දැරිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා කැඳවනු ලැබූ විශේෂ රැස්වීමක දී, ඒ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්ද සංඛ්‍යාවකින් සම්මත කර ගනු ලැබූ දෝෂාරෝපණ යෝජනාවක් මත, අධ්‍යක්ෂවරයකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(4) ධූරයෙන් ඉල්ලා අස්වන හෝ ඉවත් කරනු ලබන අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂ වශයෙන් තමා පත් කරනු ලැබීමට ඉක්බිතිවම පූර්වයෙන් උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකුව සිටියේ නම් ඔහු විශ්‍රාම යෑමේ වයසට එළඹ නොමැති නම්, ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ඔහුගේ නිත්‍ය තනතුරට ඔහුට පෙරලා පැමිණිය හැකි ය.

(5) රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනයම් හේතුවක් නිසා තම ධූරයේ කාර්ය ඉටු කිරීමට අධ්‍යක්ෂවරයාට තාවකාලිකව නොහැකි වුවහොත්, උපකුලපතිවරයා විසින්, එසේ කාර්ය ඉටුකිරීමට නොහැකි වීමෙන් දින හතක් ඇතුළත අධ්‍යක්ෂ ධූරයේ කාර්ය ඉටුකිරීම සඳහා ඔහු විසින් සුදුසු යයි හැඟෙන අයකු පත් කිරීමට කටයුතු යෙදිය යුතු ය. එසේ වැඩපිළිවෙලක් යොදන තෙක්, විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා විසින් එම ධූරයේ එදිනෙදා කාර්යය කරගෙන යා යුතු ය.

(6) අධ්‍යක්ෂ ධූරයේ කිසියම් පුරප්පාඩුවක් පවතින අවස්ථාවක දී, කොමිෂන් සභාව මගින් ඒ පුරප්පාඩුව ඇති වී දින හතක් ඇතුළත ඒ අධ්‍යක්ෂ ධූරයේ කටයුතු කරගෙන යාම සඳහා එයට සුදුසු යයි හැඟෙන අයකු පත් කිරීම සඳහා යම් කටයුතු පිළියෙල කළ යුතු ය. එසේ වැඩ පිළිවෙලක් යොදන තෙක් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා විසින් එම ධූරයේ එදිනෙදා කාර්යය කරගෙන යා යුතු ය.

08. (1) අධ්‍යක්ෂවරයා, ප්‍රධාන විධායක නිලධරයා සහ ආයතනයේ ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා විය යුතු ය. ඔහු කළමනාකාර මණ්ඩලයේ, ශාස්ත්‍රීය කමිටුවේ සහ ආයතනයේ අධ්‍යයන මණ්ඩල සියල්ලේ නිසි බලයෙන් පත් වූ සාමාජිකයෙකු විය යුතු ය. ඔහුට වෙනත් යම් අධිකාරියක හෝ ආයතනයේ මණ්ඩලයක කිසියම් රැස්වීමක් නියෝජනය කිරීමට සහ එය ඇමතීමට හිමිකම් ඇති නමුදු ඔහු එවැනි යම් අධිකාරියක හෝ මණ්ඩලයක සාමාජිකයෙකු නම් මිස එවැනි යම් රැස්වීමක දී ඡන්දය භාවිත කරනු ලැබීමට හිමිකම් නොලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා ඔහු වෙත කලින් කලට නීත්‍යානුකූලව නිකුත් කරනු ලැබිය හැකි යම් විධානවලට අනුකූලව, ආයතනයට අදාළ වන පරිදි නියමාවලියේ හා පනතේ විධිවිධාන යථා පරිදි පිළිපැදීම ගැන වගබලාගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්ය විය යුතු අතර තත් කාර්ය සඳහා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි සියළු බලතල ඔහුට තිබිය යුතු අතර ඔහු විසින් ඒ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) කළමනාකරණ මණ්ඩලයේ තීරණ බලාත්මක කිරීම සහ ඒවා බලාත්මක කළ බවට සහතික කිරීම අධ්‍යක්ෂවරයාගේ කාර්ය විය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා ආයතනයේ ගිණුම් නිලධරයා විය යුතු ය.

(5) ආයතනය තුළ විනය පවත්වාගෙන යාම සඳහා විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ නියෝග යටතේ අධ්‍යක්ෂවරයා වගකිව යුතු ය. විනය පවත්වාගෙන යාමට අදාළ කිසියම් අතුරු ව්‍යවස්ථාවක් නොමැති අවස්ථාවක දී, සුදුසු අතුරු ව්‍යවස්ථාවක් සහ විශ්වවිද්‍යාලයේ වෙනත් යම් රීති අදාළ කරගනු ලැබිය යුතු ය.

09. මණ්ඩලය ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලයකින් සමන්විත විය යුතු අතර එය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(1) නිලබලයෙන් පත් වූ සාමාජිකයන්, නම් වශයෙන්,

(අ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා ;

(ආ) අධ්‍යක්ෂවරයා ;

(ඇ) විශ්වවිද්‍යාල අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු ;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු ;

(ඉ) විශ්ව විද්‍යාලයේ කලා සහ සංස්කෘතික පීඨයේ පීඨාධිපති ;

(ඊ) ආයතනයේ එක් එක් අධ්‍යයනාංශයේ ප්‍රධානීන්.

(2) සාමාජිකයන් නම් වශයෙන් .-

(අ) විශ්වවිද්‍යාල සභාව විසින් එහි සාමාජිකයින් අතරින් පත්කළ සාමාජිකයින් දෙදෙනෙකු.

(ආ) විශ්වවිද්‍යාල සනාථන සභාව විසින් එහි සාමාජිකයන් අතුරින් නම් කළ සහ විශ්වවිද්‍යාල සභාව විසින් පත්කළ නියෝජිතයන් දෙදෙනකු.

(ඇ) කොමිෂන් සභාව විසින් පත්කළ තැනැත්තන් තිදෙනකු.

(ඈ) ශාස්ත්‍රිය කමිටුව විසින් එහි සාමාජිකයන් අතරින් නම්කළ තැනැත්තන් දෙදෙනකු.

10. (1) මණ්ඩලයේ සභාපතිවරයා විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විය යුතු අතර ඔහු මණ්ඩලයේ රැස්වීම් සියල්ලේ මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ කිසියම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාක දී මණ්ඩලයේ සාමාජිකයන් විසින් රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් අතරින් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීමට තෝරා පත්කරගනු ලැබිය යුතු ය.

(2) නම්කළ හෝ පත්කළ යම් සාමාජිකයකු, ඔහු විසින් කලින් ධුරය හිස්කරනු ලැබ ඇත්නම් මිස, අවස්ථාවෝචිත පරිදි ඔහු නම් කළ හෝ පත්කළ දින සිට ගණන් ගැනෙන සේ වසර තුනක කාලයක් සඳහා සාමාජිකයකු ලෙස ධුරය දරනු ලැබිය යුතු අතර ඔහු ධුරයෙන් ඉවත්කර ඇත්නම් මිස නැවත නම් කරනු ලැබීම සඳහා හෝ නැවත පත්කරනු ලැබීම සඳහා සුදුසු විය යුතු ය.

එසේ වුව ද, යම් නම්කළ හෝ පත්කළ සාමාජිකයකු මත ධුර කාලය ඉකුත්වීමට පෙර තම ධුරය අත්හැර ඇත්නම්, ඔහුගේ අනුප්‍රාප්තිකයකු තම ධුරය කලින් අතහැර ඇත්නම් මිස, තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

එසේම, තවදුරටත් නම්කළ හෝ පත්කළ සෑම සාමාජිකයකුම තවදුරටත් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත්කරගනු ලැබීමට හෝ නම් කරගනු ලැබීමට සුදුස්සෙක් වූයේ යම් තත්ත්වයක් අනුව ද ඒ තත්ත්වය දරන තාක් පමණක් ඔහු තම ධුරය දැරිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් නම් කළ හෝ පත්කළ සාමාජිකයකු විසින් අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ උපකුලපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) පැමිණ නොසිටීමට, නිවාඩු ලබා නොගෙන මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට සහභාගිවීම පැහැර හරින මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු, මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් වූ තම ධුරය අත්හැර ගිය ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර. ඒ හේතුවෙන් ඇතිවන පුරප්පාඩුව පිරවීම සඳහා පත් කිරීමේ බලධරයා විසින් සුදුසු තැනැත්තකු පත් කරනු ලැබිය යුතුය.

(5) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි මණ්ඩලයේ යම් රැස්වීමකට සහභාගි වීම සඳහා වූ යම් දීමනාවක් මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය.

(6) කිසියම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය ඒ රැස්වීමේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු විය යුතු ය.

(7) එක් එක් වර්ෂයක දී රැස්වීම් අටකට නොඅඩු සංඛ්‍යාවක් පැවැත්වෙන පරිදි, අවශ්‍ය කවර අවස්ථාවක වුව ද, මණ්ඩලය රැස්විය යුතු ය.

(8) අවශ්‍ය යයි තමා සලකන කවර අවස්ථාවක නැතහොත් මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවකගෙන් ලිඛිත ඉල්ලීම ලැබී එක් සතියක් ඇතුළත සභාපතිවරයා විසින්, මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු අතර ඒ ඉල්ලීමේ යම් විශේෂ රැස්වීමක කාර්ය අන්තර්ගත කළ යුතු ය.

11. මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කළ යුතු ය :—

*(අ)* ආයතනයේ චංචල හෝ නිශ්චල දේපල සහ අරමුදල් සතුව සිටීම, දැරීම, පාලනය සහ පරිපාලනය ;

*(ආ)* මේ පනතේ විධිවිධාන වලට අනුකූලව ආයතනයට අදාළ සියළු කාරණා විධිමත් කිරීම සහ නිශ්චය කිරීම ;

*(ඇ)* නිශ්චිත කාර්ය සඳහා ආයතනයට කැමැත්තක් කරගැනීමට සපයන ලද අරමුදල් පරිපාලනය කිරීම ;

*(ඈ)* ආයතනයට රික්තවරණ, පරිත්‍යාග හා වෙනත් ප්‍රදාන මගින් පවරනු ලබන නිශ්චල හෝ චංචල දේපල, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව භාරගැනීම හා පිළිගැනීම ;

*(ඉ)* ආයතනයේ වාර්ෂික වාර්තා සහ වාර්ෂික ගිණුම් සමාලෝචනය කර ඒ වාර්තා සහ ඒ ගිණුම් විශ්වවිද්‍යාලයට සහ කොමිෂන් සභාවට භාර දීම ;

(ඊ) ආයතනයේ මුදල් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා සහ ඒවා අනුමත කිරීම සඳහා පියවර ගැනීම සහ ඒ ඇස්තමේන්තු විශ්ව විද්‍යාලයට හෝ කොමිෂන් සභාවට භාරදීම ;

(උ) සෞන්දර්ය අධ්‍යයනයේ විවිධ අංශයන්හි ප්‍රදානය කළ යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා පිළිබඳවත්, හැදෑරිය යුතු අධ්‍යයන පාඨමාලා, ලැබිය යුතු පුහුණුව, සාමාර්ථය ලැබිය යුතු විභාග පිළිබඳවත්, එවැනි උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ ශාස්ත්‍රීය විශිෂ්ඨතාවලට සුදුස්සන් වීමේ අභිලාෂය ඇති ශිෂ්‍යයන් විසින් සපුරාලිය යුතු වෙනත් කොන්දේසි පිළිබඳව ශාස්ත්‍රීය කමිටුව විමසා විශ්ව විද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ඌ) අතුරු ව්‍යවස්ථා හෝ රීති සෑදීමට බලය දෙනු ලැබ ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා හෝ රීති සකස් කිරීම ;

එසේ වුව ද, ශාස්ත්‍රීය කමිටුවේ වාර්තා සලකා බැලීමෙන් අනතුරුව මිස අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධයෙන් කිසිදු අතුරු ව්‍යවස්ථාවක් හෝ රීතියක් සාදනු නොලැබිය යුතු ය ;

(එ) ආයතනයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි, පරිශ්‍ර, ගෘහ භාණ්ඩ, උපකරණ සහ වෙනත් ද්‍රව්‍ය සැපයීම ;

(ඒ) (i) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි යම් ඉගැන්වීමේ, පරිපාලන සහ වෙනත් තනතුරු ඇති කිරීම සහ ඒ තනතුරු අවලංගු කිරීම සහ යටපත් කිරීම සඳහා ද ;

(ii) ආයතනයට පත්කළ යුතු ආචාර්යවරයන්ගේ, නිළධරයන්ගේ සහ වෙනත් සේවකයන්ගේ සුදුසුකම් සම්බන්ධයෙන්

විශ්ව විද්‍යාලයට නිර්දේශ කිරීම :—

(ඔ) ආයතනයෙහි සේවයේ යෙදී සිටින තැනැත්තන්ගේ සේවය තාවකාලිකව අත්හිටුවීම, පහකිරීම හෝ අන්‍යාකාරයකින් දඬුවම් කිරීම පිළිබඳව ප්‍රකාශිත හේතු මත විශ්ව විද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ඕ) ආයතනයේ ආචාර්යවරයන් සහ පරීක්ෂකවරයන් ලෙස පිළිගැනීමට සුදුසු ලෙස සලකනු ලබන යම් තැනැත්තන් පිළිබඳ විශ්ව විද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ක) සුදුසු යැයි පෙනී යන ප්‍රමාණයක ස්ථාවර කමිටු හෝ තත්කාර්ය කමිටු පත්කිරීම, ඒවායේ විෂය කරුණු නියම කිරීම සහ ඒ කමිටුවල වාර්තා සලකා බැලීම හා වෙනස් කිරීම් ඇතිව හෝ නැතිව ඒ වාර්තා අනුමත කිරීම හෝ ඒ වාර්තා ප්‍රතික්ෂේප කිරීම ;

(ග) ශාස්ත්‍රීය කමිටුව විමසා විශ්ව විද්‍යාලයේ සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව පනතේ 15 (VII) වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් තෝරාගත් ශිෂ්‍යයන් හැර අධ්‍යයන පාඨමාලාවට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම ;

(ච) ප්‍රයෝජනයට නොයොදා ඇති යම් ආදායමක් ද ඇතුලුව ආයතනයට අයත් කවර මුදලක් වුව ද, භාර ආඥාපනතේ 20 වන වගන්තියේ හෝ වෙනත් ලිඛිත නීතියක හෝ විධිවිධාන යටතේ භාරකාර මුදල් නීත්‍යානුකූලව ආයෝජනය කළ හැකි යම් සුරැකුම් පතක ආයෝජනය කිරීම ; නැතහොත් කොමිෂන් සභාවේ අනුමතය ඇතිව ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිලට ගැනීම සඳහා එවැනි යම් මුදලක් ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ ඒ මුදල්වලින් වියදම් සඳහා වහාම අවශ්‍ය නොවන යම් කොටසක් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථිර තැන්පත් මුදලක් ලෙස තැන්පත් කිරීම ; සහ

(ජ) ආයතනයේ ශිෂ්‍යයන්ගේ පොදු සුභසිද්ධිය ප්‍රවර්ධනය කිරීම සඳහා සුභ සාධන කමිටුවක් පත් කිරීම සහ ඒ කමිටුවේ සංයුතිය, බලතල, කාර්ය සහ කර්තව්‍ය නියම කිරීම ;

(ට) මේ නියමාවලියේ හෝ වෙනත් යම් සුදුසු සාධන පත්‍රයකින් විධිවිධාන සලසා ඇති පරිදි ආයතනයේ බලතල මත ආනුෂංගික වන්නා වූ ආයතනයේ අනෙක් සියලු බලතල ක්‍රියාත්මක කිරීම ;

එසේ වුව ද, පළමුවෙන් ශාස්ත්‍රීය කමිටුව එහි මතය මණ්ඩලය වෙත වාර්තා කිරීමේ හා යැවීමේ අවස්ථාවක් දී ඇත්තේ නම් මිස අධ්‍යයන කාරණා කිසිවකට අදාළව මණ්ඩලය විසින් කිසිදු යෝජනා සම්මතයක් සම්මත කරනු නොලැබිය යුතු ය.

එසේම තවදුරටත්, විශ්ව විද්‍යාලයේ එකඟත්වය ඇතිව මිස, එසේ සම්මත කරගන්නා ලද යෝජනාවක් ක්‍රියාත්මක නොකළ යුතු ය.

මේ ඡේදයෙහි "අධ්‍යයන කාරණා" යන්නෙන්, ශාස්ත්‍රීය කමිටුවේ පාලනයට සහ පොදු නියමයන්ට යටත් වන්නා වූ කිසියම් කාරණයක් අදහස් වේ.

12. (1) ශාස්ත්‍රීය කමිටුවක් පැවතිය යුතු අතර එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) සභාපතිවරයා විය යුතු අධ්‍යක්ෂවරයා ;

(ආ) ආයතනයේ එක් එක් අධ්‍යයන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් ;

(ඇ) විශ්ව විද්‍යාලයේ ලලිතකලා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ;

(ඈ) ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහය මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු වන විශ්ව විද්‍යාලයේ කලා සහ මානව විද්‍යා පීඨයේ පීඨ සභාවේ නාමිකයකු ;

(ඉ) සෞන්දර්ය අධ්‍යයන ක්ෂේත්‍රය නියෝජනය කිරීමට මණ්ඩලයේ නිර්දේශය මත අධ්‍යක්ෂවරයා විසින් පත් කළ සාමාජිකයන් දෙදෙනකු ;

(ඊ) ආයතනයේ එක් එක් අධ්‍යයන දෙපාර්තමේන්තුවලින් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහය මහාචාර්යවරයකු සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ;

(උ) ඉහත (ඊ) ඡේදයේ සඳහන් කරන ලද සාමාජිකයන් හැර ඉගැන්වීමට සම්බන්ධ වී ඇති ආයතනයේ නිත්‍ය කාර්ය මණ්ඩලය අතරින් තෝරා පත්කර ගත් සාමාජිකයන් දෙදෙනකු.

(2) නිශ්චිත කාර්යයක් සඳහා නිශ්චිත කාල පරිච්ඡේදයකට එක් තැනැත්තකු හෝ එක් තැනැත්තකුට වැඩි සංඛ්‍යාවක්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, ශාස්ත්‍රීය කමිටුවට, සභාවට සහය වීමට සම්බන්ධ කරගත හැකි ය. එසේ සම්බන්ධ කරගත් කිසිම අයකුට වුව ද ඡන්දයෙන් පත්වීම සඳහා ඉදිරිපත් වීමට හෝ එම විශ්ව විද්‍යාල පාලක සභාවේ රැස්වීමක දී ඡන්දය දීමට හෝ අයිතියක් නොමැති විය යුතු ය.

(3) 11 වන ඡේදයේ (2) වන සහ (4) වන අනුඡේදවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ශාස්ත්‍රීය කමිටුවේ එක් එක් පත්කළ හෝ නම් කළ සාමාජිකයන් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) ශාස්ත්‍රීය කමිටුවේ රැස්වීමක් සඳහා වන සංපූරණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට වඩා නොඅඩු විය යුතු ය.

(5) ශාස්ත්‍රීය කමිටුව අවශ්‍ය වන සෑම විටකදීම රැස්විය යුතු අතර කෙසේ වුවත් එක් එක් වර්ෂයක දී වාර දහයකට නොඅඩු රැස්වීම් සංඛ්‍යාවක් පැවැත්වෙන පරිදි, අවශ්‍ය කවර අවස්ථාවක දී වුව ද, විශ්ව විද්‍යාල පාලක සභාව රැස්විය යුතු ය.

13. (1) පනතේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ශාස්ත්‍රීය කමිටුවට ආයතනයෙහි ඉගැන්වීම, පුහුණු කිරීම්, පර්යේෂණ සහ විභාග පිළිබඳ පාලනය හා සාමාන්‍ය විධානය සතු වන්නේ ය.

(2) (1) වන අනුඡේදය මගින් ඒ මත පවරන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, ශාස්ත්‍රීය කමිටුව විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කරනු ලැබිය යුතු ය :-

(අ) මණ්ඩලය විසින් එයට යොමු කරන ලද කිසියම් කාරණාවක් සලකා බලා වාර්තා කිරීම ;

(ආ) අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩසටහන්, පුහුණු වැඩසටහන්, පර්යේෂණ වැඩසටහන් හෝ විභාගවලට සම්බන්ධ නොවන කාරණා පිළිබඳව නිර්දේශයන් සහ වාර්තා ඉදිරිපත් කිරීම ;

(ඇ) කවරවූ හෝ විශේෂ විෂයයක් හෝ විෂයයන් සලකා බලා ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීමේ කාර්යය සඳහා ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් විය හැකි කමිටුවක් පත් කිරීම ;

(ඈ) අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(ඉ) ආචාර්යවරුන් සහ පරීක්ෂකවරයන් වශයෙන් පත් කිරීම සඳහා සලකා බැලීමට ඒ තැනත්තන් පිළිබඳව මණ්ඩලයට නිර්දේශ කිරීම ;

(ඊ) නියමිත විභාග සමත්වීමෙන් සහ වෙනත් නියමිත කොන්දේසි සපුරාලීමෙන් එම අංශයට අදාළ උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලබා ඇති පුද්ගලයන් පිළිබඳ මණ්ඩලයට නිර්දේශ කිරීම ;

(උ) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ප්‍රදර්ශන, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා තරඟ කිරීමේ ක්‍රම හා කොන්දේසි පිළිබඳ මණ්ඩලයට නිර්දේශ කිරීම ;

(ඌ) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ප්‍රදර්ශන, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා සුදුසු තැනැත්තන්ගේ නම් මණ්ඩලයට නිර්දේශ කිරීම ;

(එ) මේ නියමාවලියෙන් හෝ වෙනත් යම් සුදුසු සාධන පත්‍රයකින් විධිවිධාන සලසා ඇති පරිදි ආයතනයේ බලතලවලට ආනුෂංගික වන්නා වූ හෝ අධ්‍යයන කාරණාවකට අදාළ වන්නා වූ ආයතනයේ වෙනත් යම් බලතල සියල්ල ක්‍රියාත්මක කිරීම.

14.(1) (අ) කර්නාටක සංගීතය,

(ආ) නැටුම්, නාට්‍ය සහ නෘත්‍යකලා,

(ඇ) රූපණ සහ ශිල්පකලා,

පුහුණු කිරීම සම්බන්ධයෙන් අධ්‍යයන දෙපාර්තමේන්තුව පැවතිය යුතු ය.

(2) එක් එක් අධ්‍යයන දෙපාර්තමේන්තුවල, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහය මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු විය යුතු දෙපාර්තමේන්තු ප්‍රධානියකු සිටිය යුතු අතර ඔවුන් අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) දෙපාර්තමේන්තුවක ප්‍රධානියා ඔහු පත් කරන දිනයේ සිට ගණන් ගැනෙන සේ අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස ඔහු නැවත පත් කිරීම සඳහා සුදුසු විය යුතු ය.

(4) නිවාඩු ගැනීම, රෝගාතුරවීම හෝ වෙනත් හේතුවක් නිසා දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මාස තුනකට නොවැඩි කාලයක් සඳහා ස්වකීය ධුරයේ කටයුතු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දී, ඒ කාලය සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ තනතුරේ කටයුතු කිරීමට මහාචාර්යවරයකු, සහය මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු පත් කරනු ලැබිය යුතු ය. එසේ වුවද, දෙපාර්තමේන්තු ප්‍රධානියකු විශ්‍රාම ගන්නා විට හෝ ඉල්ලා අස්වන විට හෝ වෙනත් හේතුවක් නිසා මාස තුනකට නොවැඩි කාලයක් සඳහා ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට නොහැකි වන අවස්ථාවක දී දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ තනතුර පුරප්පාඩු වූ ලෙස සැළකිය යුතු අතර (1) වන අනුඡේදයට අනුකූලව අලුත් දෙපාර්තමේන්තු ප්‍රධානියකු පත් කරනු ලැබිය යුතු ය

15. ආයතනයේ මුදල් වර්ෂය ආණ්ඩුවේ මුදල් වර්ෂය හා සමාන වන්නේ ය.

16. (1) ආයතනයට අරමුදල් එකක් හෝ ඊට වැඩි ගණනක් තිබිය යුතු අතර, පහත සඳහන් මුදල් එයට ගෙවිය යුතු ය :-

(අ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන අනුව ආයතනයට ගෙවිය යුතු වූ, සියලු ගාස්තු ;

(ආ) පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදන කරන ලදුව කොමිෂන් සභාව විසින් ආයතනයට ආධාර මුදල් වශයෙන් වෙන් කරනු ලබන්නා වූ මුදල් ;

(ඇ) බාහිර හෝ ව්‍යාප්ත කරන ලද කටයුතු සහ සේවා මාර්ගයෙන් උපයන ලද සියලු ආදායම් ;

(ඈ) පරිත්‍යාගවලින් ලැබෙන ආදායම ; සහ

(ඉ) කවරාකාරයේ හෝ කිසියම් මූලාශ්‍රයකින් ආයතනයට උපචිත වූ වෙනත් යම් මුදලක්.

(2) ඉහත එක් එක් ප්‍රභේදයන්ගෙන් වූ ආදායම් වෙන් වෙන් වශයෙන් ගණන් බලනු ලැබිය යුතු ය.

(3) සෑම මාසයක් තුළ දී අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් පිළිබඳ සාරාංශයක්, උචිත ආදායම් ශීර්ෂ යටතේ වර්ග කර, ඊළඟ ඉදිරි මාසය අවසානවීමට පෙර අධ්‍යක්ෂ විසින් කොමිෂන් සභාවට දැනගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

17. (i) නියමාවලි මගින් පනවනු ලැබිය හැකි පිළිවෙලට හා ආකාරයට ආයතනයේ ගණන් තැබීම ;

(ii) අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් භාරගැනීම සහ ඒ මුදල් නිසි ගණන් ශීර්ෂයන්ට බැර කිරීම ;

(iii) බලය දෙනු ලැබූ සියලු ගෙවීම් සිදු කිරීම, කොමිෂන් සභාවට අවශ්‍ය ඇස්තමේන්තු සහ ඉදිරි මුදල් වර්ෂය සඳහා වාර්ෂික මුදල්. විසර්ජන මණ්ඩලය සඳහා පිළියෙල කිරීම;

අධ්‍යක්ෂවරයාගේ කාර්ය වන්නේ ය.

එසේ වුව ද, ආයතනයේ ගිණුම්වල නිශ්චිත කාර්ය සඳහා කරනු ලබන ප්‍රතිපාදනවලින් හෝ නිශ්චිත අරමුණු සඳහා වූ පරිත්‍යාගවලින් ලැබෙන ආදායම් සම්බන්ධයෙන් වෙනම ගිණුම් පෙන්නුම් කළ යුතු අතර ආයතනයේ සාමාන්‍ය කාර්ය සඳහා හෝ ඒ ප්‍රතිපාදන හෝ පරිත්‍යාග කරනු ලැබුවේ පිළිවෙලින් යම් කාර්ය හෝ අරමුණු සඳහා ද, ඒ කාර්ය හෝ අරමුණු නොවන කරුණු සඳහා ඒ ආදායමෙන් කිසිදු ගෙවීමක් නොකළ යුතු ය.

18. (1) කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන පිළිවෙලට හා ආකාරයට සහ එසේ නියම කරනු ලබන විස්තර ඇතුළත් කොට සිය ආයතනයේ කටයුතුවලට අදාළ වාර්ෂික ගණන් සහ සංඛ්‍යාලේඛන පිළිබඳ ප්‍රකාශයක් ආයතනය විසින් පිළියෙල කළ යුතු ය.

(2) ආයතනයේ ගිණුම් පොත් ආයතනයේ කාර්යාලයෙහි තැබිය යුතු ය.

19. උසස් අධ්‍යාපන ආයතනයක ගණන් විගණනය සම්බන්ධයෙන් අදාළ පනතේ XIII වන කොටසේ යම් විධිවිධානයක් අවශ්‍ය වෙනස් කිරීම් ද සහිතව, ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

20. (1) ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි ආයතනය විසින් විශ්ව විද්‍යාලයේ එකඟත්වය සහ කොමිෂන් සභාවේ අනුමතිය ඇතිව සලකනු ලබන නිලධරයන්, ආචාර්යවරයන් සහ වෙනත් සේවකයන් ආයතනයේ කාර්ය මණ්ඩලයට අයත් විය යුතු ය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලය විශ්ව විද්‍යාලය විසින් ස්වකීය කාර්ය මණ්ඩලයෙන් මුදා හැරීමෙන් ලබා දිය යුතු ය ; නැතහොත් අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාව විසින් හෝ විශ්ව විද්‍යාලය විසින් හෝ පත්කළ යුතු ය. පනතේ X වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම් කෙරෙහි හා පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(3) විශ්ව විද්‍යාලයේ නිලධරයකු, ආචාර්යවරයකු හෝ වෙනත් සේවකයකු ආයතනයේ සේවය සඳහා පූර්ණ කාල පදනමක් මත මුදා හැර ඇති අවස්ථාවක, විශ්ව විද්‍යාලයේ ඔහුගේ නිත්‍ය තනතුරට හිමි වේතනය හා දීමනා ආයතනය විසින් ඔහුට ගෙවිය යුතු ය. අනෙකුත් අවස්ථාවක, විශ්ව විද්‍යාලය විමසීමෙන් පසු කොමිෂන් සභාවේ අනුමතය පරිදි ආයතනය විසින් නිශ්චය කරනු ලබන දීමනාවක් අදාළ නිලධාරියාට, ආචාර්යවරයාට හෝ වෙනත් සේවකයෙකුට ගෙවිය හැකි ය.

(4) ආයතනයේ කාර්ය මණ්ඩලය, අධ්‍යක්ෂවරයාගේ විධානයන්ට සහ විනය පාලනයට යටත් විය යුතු ය.

(5) විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩලයට සහ ශිෂ්‍යයන්ට අදාළ කරගත හැකි විනය රීති සහ ක්‍රියා පරිපාටිය ආයතනයේ සිටින තැනැත්තන්ට ද අදාළ කරගනු ලැබිය යුතු ය.

21. මේ පනතේ XIX වන කොටස අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ආයතනය විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා නියෝග සහ රීතිවලට සහ ඒ සම්බන්ධයෙන්, අදාළ කරගත යුතු ය.

22. කිසියම් අධිකාරියක හෝ ආයතනයේ වෙනත් මණ්ඩලයක කිසිදු ක්‍රියාවක් යෝජනා සම්මතයක් හෝ නඩු කටයුත්තක් ඒ ආයතනයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් හෝ පුරප්පාඩු පැවතීම හෝ යම් සාමාජිකයකු පත් කිරීමේ දී යම් දෝෂයක් හෝ දෝෂ පැවතීම හේතුවෙන්ම පමණක් බල රහිත නොවන්නේ ය.

23. විශ්ව විද්‍යාලයේ නිර්දේශය මත, නියමාවලියේ යෝජනා සම්මතයකින් විධිවිධාන සැලසිය නොහැකි යම්කිසි අනපේක්ෂිත ගැටලුවක දී යෝජනා සම්මතයක් සඳහා අවශ්‍ය පියවර ගැනීමට කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය.

24. මේ නියමාවලියේ -

"පනත" යන්නට 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත අදහස් වේ ;

"සුදුසු සාධන පත්‍රය" යන්නට පනතේ ඒ සඳහා දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"ගුරුවරයා" යන්නට පනතේ ඒ සඳහා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

06-416

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

2- G - 005535